# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 10 ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

වාරය - II

**ඒකකය - (04) බැද්දේගම**

**ඉගෙනුම් පල :**

- බැද්දේගම නවකතාවේ පසුබිම විස්තර කරයි.
- බැද්දේගම නවකතාවේ නිර්දිෂ්ට කොටසේ අවස්ථා සම්බන්ධය පැහැදිලි කරයි.
- බැද්දේගම නවකතාවේ නිර්දිෂ්ට කොටසේ ගැබ්වූ නවකතා ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- බැද්දේගම නවකතාව රස විඳිමින් විචාරය කරයි.

## (04) බැද්දේගම

**පෙරවදන**

''බැද්දේගම'' සිංහල ජන දිවිය ඇසුරු කොට ලියන ලද ඉංග්‍රීසි නවකතාවන් අතුරෙන් ශ්‍රේෂ්ඨතම කෘතිය බව විචාරකයන්ගේ පිළිගැනීම ය. මෙහි චරිත නිරූපණය කොතරම් මනහර දැයි කිව මනා නො වේ. ලක්දිව ඈත ගම්බද පෙදෙසක වෙසෙන අර්ධ ශිෂ්ට ජනයාගේ දුර්බෝධ චිත්ත චෛතසික තත්ත්වය ඉංග්‍රීසිකාරයකු විනිවිදි දුටු සැටි චමත්කාරජනක ය. සිලිඳුගේ චරිතය වූ කලී සාහිත්‍ය චිත්‍ර ශාලාවෙහි ඇඳ තිබෙන අමරණීය බිතු සිතුවම් අතුරින් එකකි.

**- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්
බැද්දේගම නවකතාවට ලියූ පෙරවදන ඇසුරෙනි.**

**බැද්දේගම නවකතාව ලිවීම හා එහි පසුබිම**

''මානව ජීවිතය විවරණ කරන ගද්‍යමය, කල්පිත ආඛ්‍යානය වූ කලී නවකතාව යි.''

**- හෙන්රි ජේම්ස්**

**01. අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි උත්තරය තෝරා ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න.**

**1. ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුණු Village in the Jungle නවකතාවේ කතුවරයා ලෙනාඩ් වුල්ෆ් මහතා ය. ඔහු ගේ උපන්දිනය ලෙස සැලකෙන්නේ,**

1) 1880 ඔක්තෝබර් 26    3) 1880 නොවැම්බර් 25
2) 1881 ඔක්තෝබර් 26    4) 1881 නොවැම්බර් 25



Copyright©www.e-thaksalawa.moe.gov.lk

**2.** **ලෙනාඩ් වුල්ෆ් මහතා උපත ලද්දේ,**

1) ලන්ඩනයේ කෙන්සිටන් නුවර දී ය.
2) ප්‍රංශයේ පැරිස් නුවර දී ය.
3) ඇමරිකාවේ වොෂින්ටන් හී දී ය.
4) එංගලන්තයේ රොඩ්මෙල් හී දී ය.

**3.** **එතුමා මූලික අධ්‍යාපනය ලැබූ පාසලක් නො වන්නේ,**

1) ලන්ඩන් හි ශාන්ත පාවුළු විද්‍යාලය
2) කේම්බ්‍රිජ් හි ට්‍රිනිටි විද්‍යාලය
3) සසෙක් හි බ්‍රිග්ටන් හි පාසල
4) ලන්ඩනයේ හයිගේට් හි බයිරොන් පාසල

**4.** **ලෙනාඩ් වුල්ෆ් මහතා මුලින් ම ලංකාව ට පැමිණියේ,**

1) 1903 නොවැම්බර් මස දී ය.
2) 1904 ඔක්තොබර් මස දී ය.
3) 1904 නොවැම්බර් මස දී ය.
4) 1903 ඔක්තෝබර් මස දී ය.

**5.** **ලෙනාඩ් වුල්ෆ් මහතා රාජකාරිය නො කළ ලංකාවේ ප්‍රදේශයක් වන්නේ,**

1) යාපනය
2) මහනුවර
3) කුරුණෑගල
4) හම්බන්තොට

**6.** **'විලේජ් ඉන් ද ජංගල්' කෘතිය ලියැවුණු වර්ෂය කුමක් ද?**

1) 1910
2) 1911
3) 1912
4) 1913

**7.** **ලෙනාඩ් වුල්ෆ් මහතා එංගලන්තයේ 'රොඩ්මෙල්' හි දී මෙලොවින් සමුගත්තේ ය. ඒ,**

1) 1969 අගෝස්තු 14 වැනි දින දී ය.
2) 1969 අගෝස්තු 13 වැනි දින දී ය.
3) 1970 අගෝස්තු 14 වැනි දින දී ය.
4) 1969 අගෝස්තු 15 වැනි දින දී ය.

**8.** **''විලේජ් ඉන් ද ජංගල්'' නවකතාව ''බැද්දේගම'' නමින් සිංහලට අනුවර්තනය කළේ,**

1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.
2) කේ. ජී. කරුණාතිලක මහතා ය.
3) ඒ. පී. ගුණරත්න මහතා ය.
4) අභය හේවාවසම් මහතා ය.



Copyright©www.e-thaksalawa.moe.gov.lk

**9.** **ඒ. පී. ගුණරත්න මහතා අතින් ''වානරයා'' නමින් සිංහලට හැරවුණු "The Monkey" කෘතියේ කතුවරයා වන්නේ,**

1) ඇන්ටන් චෙකොෆ් 3) ආර්.එල්. ස්පිටල්
2) ගී ද මෝපසං 4) චූ චෙං එන්

**10.** **ඒ.පී. ගුණරත්න මහතා අතින් පරිවර්තනය නොවූ කෘතියක් දක්වෙන පිළිතුර වන්නේ,**

1) වන සරණ 3) මැකී ගිය දඩමං
2) සුදු ගෝනා 4) ටාර්සන්

**02.** **බැද්දේගම නවකතාවේ නම වැනි පරිච්ඡේය ඇසුරින් පෙළ ගස්වා ඇති පහත ප්‍රකාශයන් හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් මත ලියන්න.**

1. ගමේ මහෙස්ත්‍රාත් විභාගය පැවැත්වූයේ සිලිඳු ප්‍රනාන්දුත්, ආරච්චිත් මරා දැමූ නිසා ය. ☐
2. සිලිඳුගේ අණට කීකරු ව පුළුවන් උපක්‍රමයකින් බබුන් එනතුරු කර්ලිනාහාමිත් සමග ගෙදර බලා සිටිනවා විනා පුංචිමැණිකා විසින් කළ හැකි අන් කිසිවක් නො වී ය. ☐
3. බබුන් සිරගෙට නියම වීම, පියා අහිමි වීම, ජීවන මාර්ගයක් හෝ ආහාරයක් නොමැති වීම සිලිඳු එකපිට එක මුහුණ දුන් අතෝරයන් ය. ☐
4. පුංචිමැණිකා දවසින් වැඩි කාලයක් ගත කළේ තමා ඉදිරියේ මැවී තිබුණු භය ජනක අවිනිශ්චිත අඳුරු අනාගතය පිළිබඳ නොසන්සුන් බැවිනි. ☐
5. අච්ච හා සුළඟත්, වෙහෙසත්, බඩගින්නත්, ලෙඩ දුකත් ගැමියන්ගේ ශරීර ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද වැඩි කළේ ය. ☐
6. කර්ලිනාහාමි පුංචිමැණිකාගේ තනි නොතනියට සිටි ගසක පොත්තක් මෙන් ගොරහැඩි ව රැළි වැටී අවයව ඇලී ගිය සමකින් යුක්ත වූ තරුණ ගැහැනියක් වූවා ය. ☐
7. වියපත් කළ මේ ගමේ ගැහැනුන්ගේ ජීවිත ගෙවෙන්නේ පිරිසිදු ජලය නැති දියකඩිති අසල ය. ☐
8. බැද්දේගම ක්‍රමයෙන් පිරිහී ගොස් අවටින් තෙරපා ගෙන එන මහ බැද්දට බත් වී යන වනගත කුඩා ගමකි. එහි වූයේ ගෙවල් හයකි. පිරිස 25 කි. ☐


Copyright©www.e-thaksalawa.moe.gov.lk

9. ආරච්චිගේ මරණයෙන් පසු නැන්චොහාමි ගම අතහැර යන්න තීරණය කළේ බැද්දේගම හොල්මන් අඩිකෝඩ පිරුණු යකුන් අරක් ගත් කාලකණ්ණි ගමක් ලෙස සලකමිනි.

10. දිනෙන් දින බලාපොරොත්තු බිඳ වැටීම නිසා අසරණ වන පුංචිමැණිකා බබුන් ඒවි යැයි සිතා ගෙන ඇතැම් දිනවල කඹුරුපිටියට වැටී ඇති පාර දිගේ ටික දුරක් ගොස් දෙදරුම් කෑ හදවතින් යුතුව යළි පැලට එයි.

11. පුංචිමැණිකා නිශ්ශබ්දව ම වෙදරාළගේ ගෙයින් සෙමින් දොරට බැස ගෙදර ගියේ තංගල්ලට යෑමේ අධිෂ්ඨාන ඇතිව ය.

12. ''සුදු දූවිලි සහිත කෙළින් දිවෙන මහ පාරේ දී ඇයට භයානක විදිහේ තනිකමක් දැනුණි.'' යන යෙදුමේ පුංචිමැණිකාගේ තනිකමේත් බියේත් පීඩනයෙන් පිරුණු දීර්ඝ ජීවිතයේත් සංකේතාර්ථයක් බඳු ය.

13. කඳු මුදුනේ විශාල සුදු ගොඩනැගිල්ල දැකීම පුංචි මැණිකාගේ සිතේ උපන් බලාපොරොත්තුව හා ගමනේ නිමාව දැකීමෙන් ලබන ආස්වාදයේ සංකේතයක් බඳු ය.

14. මහල්ලා පුංචිමැණිකාට කීවේ තමාගේ පුතු මෙන් ම බබුන් ද යළි නො එන බව ය.

15. හිරපල්ලා කී දෙය අසා පුංචිමැණිකා කඳුලක්වත් නො හෙලා බලා සිටියේ ඒ වේදනාව ඇයට නොදැනුණු නිසා ය.

**බැද්දේගම නවකතාවේ අවස්ථා සම්බන්ධ ලිවීම.**

**03. අංක 1 සිට 6 තෙක් දී ඇති සියලු ම ප්‍රශ්නවල අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න.**

**1. 'ඔව්' මං හිතනවා මිනිහා මැරිලා කියලා**

1) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?
2) මෙහි දී මිනිහා යනුවෙන් අදහස් කළේ කවරෙක් ද?
3) මෙම ප්‍රකාශයට සවන් දුන්නේ කවරෙක් ද?
4) මෙය කුමන අවස්ථාවක සිදු කළ ප්‍රකාශයක් ද?
5) මෙහි මිනිහා යනුවෙන් හැඳින් වූ අය සහ ප්‍රකාශයට සවන් දුන් අය අතර තිබූ සබඳතාව කුමක් ද?

**2. ''රාළහාමි, ඇත්තට ම මේ ගැන මුකුත් දන්නවා ද?''**

1) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?


Copyright©www.e-thaksalawa.moe.gov.lk

2) රාළහාමි යනුවෙන් ඇමතුම් ලැබුවේ කවරෙකු ද?
3) මේ ගැන යනුවෙන් දැක් වූයේ කුමක් ද?
4) මේ පාඨය ඇතුළත් කෘතිය කුමක් ද?
5) මේ ප්‍රකාශයට ලද පිළිතුර ලියන්න.

**3.** **"දැන් මාස හය පහුවෙලා. ඒත් එයා ගමට ආවේ නෑ."**

1) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?
2) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරෙක් ද?
3) එයා යනුවෙන් දැක් වූ අයගේ නම ලියන්න.
4) මෙහි සඳහන් ගමෙහි නම කුමක් ද?
5) මෙහි දැක්වෙන එයා යන අය රඳවා තබා ඇති ස්ථානය කුමක් ද?

**4.** **"හැම තිස්සෙ ම බිත්තිවලින් වට කරගෙන"**

1) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?
2) ශ්‍රවණය කළේ කවරෙක් ද?
3) බිත්තිවලින් වට කර තැබූයේ කුමක් ද?
4) එය පිහිටි ප්‍රදේශයේ නම කුමක් ද?
5) මෙම ප්‍රකාශය කළ අය කුමන ගම්මානයක අයෙක් ද?

**5.** **"මොන වැරද්දට ද හිරේ වැටුණෙ?"**

1) මෙසේ විමසූයේ කවරෙක් ද?
2) ඊට ලද පිළිතුර කුමක් ද?
3) මෙහි සඳහන් පරිදි හිරේ වැටුණු දෙදෙනෙකුගේ නම් ලියන්න.
4) මේ ප්‍රකාශයෙන් පසුව සිදු වූයේ කුමක් ද?
5) මෙය උපුටා ගත්තේ බැද්දේගම නවකතාවේ කී වෙනි පරිච්ඡේදයෙන් ද?

**6.** **"නෑ අයියා සතයක්වත් නෑ. අපි බොහොම දුප්පත් මිනිස්සු."**

1) මෙම ප්‍රකාශය කරන්නේ කවරෙකු විසින් ද?
2) අයියා යනුවෙන් ඇමතුම් ලබන්නේ කවරෙක් ද?
3) ඇමතුම ලැබූ තැනැත්තා මින් අනතුරුව කරන යෝජනාව කුමක් ද?
4) අපි යනුවෙන් හඳුන්වා ගත් අයගේ පවුලේ අයෙකුගේ නමක් ලියන්න.
5) මෙම ප්‍රකාශයෙන් පසුව දැනගන්නට ලැබුණු දුක්බර පුවතක් ලියන්න.

**බැද්දේගම නවකතාවේ නිරූපිත චරිත හඳුනා ගැනීම**

**04. පහත දැක්වෙන ප්‍රකාශයන් සඳහා ගැළපෙන පදය තෝරා හිස්තැන් මත ලියන්න.**



Copyright©www.e-thaksalawa.moe.gov.lk

❖ **සිලිඳු**

1. බැද්දේගම නවකතාවේ ....................................... චරිතයකි. (ප්‍රධාන/අතුරු)

2. අන් හැම ගැමියෙකු මෙන් ම සිලිඳු ද ....................................... (කපටියෙකි/ගොවියෙකි)

3. ....................................... ගේ මෙන් ඇකුළුණු මුහුණක් ඇත්තෙකි. (සිංහයකු/රිලවකු)

4. මේ සන්සුන් පුද්ගලයාට ....................................... යැයි ගම්මු කීවෝ ය. (ටිකක් පිස්සු/හොඳට ම පිස්සු)

5. කෙනෙකු තමාට වරදක් කළාට ....................................... සිරිතක් ඔහුට නැත. (පිළිගන්නා/පලිගන්නා)

6. තමන්ගේ දියණිය වූ ....................................... (පුංචිමැණිකාට/ඩිංගිහාමිට) කරදර කළ ....................................... (ප්‍රනාන්දු/බබුන්) මරා දැමීම තුළින් ගම්‍යමාන වන්නේ සිලිඳු ....................................... (තම දරුවන්ගේ/තමාගේ) යහපත වෙනුවෙන් අපරිමිත කැපකිරීම් කළ ....................................... (පියෙකු/සහෝදරයකු) බව ය.

7. තම දියණියගේ අනාගතය ....................................... (යහපත්/අයහපත්) වනු දැකීමේ අපේක්ෂාවෙන් කල් ගෙවූ සිලිඳු පුළුවන් ....................................... (උපක්‍රමයකින්/හදිසියකින්) ....................................... (බබුන්/පුංචිරාළ) ආපසු එනතුරු ....................................... (කර්ලිනාහාමි/පුංචිරාළ) සමග ගෙදර සිටින්නට පුංචිමැණිකාට කීවේ ....................................... (මහෙස්ත්‍රාත් විභාගයට/අද්වකාත් විභාගයට) ගමට ගෙන ආ දවසේ දී ය.

❖ **කර්ලිනාහාමි**

1. කර්ලිනාහාමි ගමේ කෙළවරේ ගෙයක වාසය කළ ....................................... (සිලිඳුගේ/බබෙහාමිගේ) සහෝදරියක් වූවා ය.

2. උණ රෝගයෙන් පෙළෙමින් සිටි ඇගේ සැමියා ....................................... (මියගොස්/අසාධ්‍ය වී) දෙමසකට පසු ලැබුණු ....................................... (දරුවා/දැරිය) ද මිය ගියේ ය.

3. දැන් කර්ලිනාහාමිගේ වයස අවුරුදු ....................................... (පණහක්/හැටක්) පමණ වෙයි.

4. ඇගේ ....................................... (සම/ඇස්) ඇටයට ඇලී රැලි වැටී ගියේ ය. ළැම ....................................... (වියලී/ඇකිළී) ගොසිනි.

5. ''විපත්ති ගණනාවක් ම සිදුවීගෙන යන බව ....................................... (සිහිනයකින්/හැබහින්) මෙන් ඇයට පෙනී ගිය නමුත් කරුණු වශයෙන් ඒවා සලකා ගැනීමට ඇගේ ....................................... (පටල සහිත මොළය/ගිලී ගිය දෙනෙත) ශක්තිමත් වූයේ නැති.'' යන ප්‍රකාශයෙන් හැඟවෙන්නේ .......................................


Copyright©www.e-thaksalawa.moe.gov.lk

(කර්ලිනාහාමි/පුංචිමැණිකා) අවට ලෝකය ගැන ...................................... (සංවේදී වන/දුක්වෙන) මානසික ක්‍රියාකාරිත්වය පවා හීන වී ගිය අසරණ ගැහැනියක් ලෙසිනි.

❖ **පුංචිරාළ**

1. බැද්දේගම විසූ ...................................... (වෙදෙකු/ගුරුවරයකු) වූ පුංචිරාළ කට්ටඩියෙකි.

2. බබෙහාමි මිය ගිය පසු ඔහු ගමෙහි ...................................... (ආරච්චිල/අද්වකාත්) බවට පත් විය.

3. පුංචිමැණිකා ...................................... (බබුන්/සිලිඳු) ගැන විමසන්නට ගිය අවස්ථාවේ ''ඉළන්දාරියෙක් නැත්නම් නාකියෙක් වුණත් මොකක් ද ඇති වැරැද්ද කසාද බැඳ ගනින්'' යන ප්‍රකාශය කළේ පුංචිමැණිකා සිය ...................................... (වසඟයට/සේවයට) ගැනීමේ සිතුවිලිවලින් ...................................... (පෙළුණු/කැපවුණු) ...................................... (කපටියෙකු/අහිංසකයකු) ලෙසිනි.

❖ **පුංචිමැණිකා**

1. අහිමි වීම් රැසක් හමුවේ අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වූ අසරණ ගැහැනියකි.

   (1) මව - ඩිංගිහාමි

   .........................................................................................................................

   (2) ස්වාමියා - බබුන්

   .........................................................................................................................

   (3) පියා - සිලිඳු

   .........................................................................................................................

   (4) සහෝදරිය - හින්නිහාමි

   .........................................................................................................................

   (එක් එක් අය අහිමි වූ අයුරු තිත් ඉරි මත ලියන්න.)

2. නීතියේ ආධිපත්‍ය හමුවේ නිරුත්තර වූ අසරණ දියණියකි.

   ''පොලිස් භටයා සමග යද්දී කතා ......................................................................................
   ......................................................................................................... ලැබිණි.''

   (උපුටා ඇති උද්ධෘතය පාඩමෙන් තෝරා සම්පූර්ණ කරන්න.)

3. භය ජනක, අඳුරු, අවිනිශ්චිත අනාගතයක් උරුම වූ තරුණියකි.

   .........................................................................................................................

   (අදාළ උද්ධෘතය පාඩමෙන් උපුටා ලියන්න.)

4. බිඳ වැටෙන බලාපොරොත්තු හමුවේ ශෝකයෙන් පීඩිත වූ බිරිඳකි.

   ''හැන්දෑවට කඹුරුපිටිය දෙසට ......................................................................................



Copyright©www.e-thaksalawa.moe.gov.lk

.....................................................................................................................................

.....................................................................................................................................

දෙදරුම් කැවේ ය.''

(අදාළ උද්ධෘතයේ ඉතිරි කොටස් පාඩමෙන් සොයා ලියන්න.)

5. දෙදරුම් කෑ හදවතකින් සියල්ල ඉවසා ජීවිතයට මුහුණ දීමට සිතා ගත්තියකි.

''එයා මැරිලා සීයෙ''

''ඔව් .......................................................................................................................''

''මං ..........................................................................................................................''

(සංවාද සම්පූර්ණ කරන්න.)

6. ඉතාම දුප්පත් නූගත් ගැමි තරුණියකි.

''නෑ අයියා .................................................................................................................''

''ඇයි මෝඩියේ .............................................................................................................''

(අදාළ උපුටා ගැනීම් සම්පූර්ණ කරන්න.)

7. නොපසුබටව ජීවිත අභියෝගයනට මුහුණ දෙමින් නො සැලෙන ආත්ම ශක්තියකින් කටයුතු කළ පතිනියකි.

''................................................................................................................................''

(ආරච්චිගෙ දූලට හසු නොවී තනියම කඹුරුපිටියට ගිය අවස්ථාවක උද්ධෘතයක් ලියන්න.)

''................................................................................................................................''

(අනුන්ගේ හේන්වල වැඩ කරමින් වනයට ගොස් කෑ හැකි දෙයක් සොයා කටයුතු කිරීමේ අවස්ථාව ඇසුරෙන් උද්ධෘත උපුටන්න.)

8. පුංචිමැණිකා කලබල නැති සාන්ත ගතිගුණ වලින් යුක්ත තැනැත්තියක බවත් විටෙක මුවැත්තියක තරම් අහිංසක බවත් ගැමියෝ කීහ.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

(පුංචිමැණිකාගේ කලබල නැති ගුණය..... (47 පිටුව) උපුටා දක්වන්න.)

**නිර්දේශිත පරිච්ඡේදය (9) තුළ හමුවන භාෂා ලක්ෂණ**

''ඒ.පී. ගුණරත්න මහතා විසින් ව්‍යවහාර කරන ලද මට සිලිටු වාග්මාලාව වනාහි මේ නවකතාවේ ස්වභාවිකත්වයට අතිශයින් තුඩු දෙන්නකි. ඔහු විසින් උපයෝගී කොට ගෙන තිබෙන සරල, ඍජු, අලංකාර රහිත රචනා විලාසය වනාහි මුල් කතාවෙහි තාත්වික රස සමූහය උද්වහනය කිරිමෙහි ලා අතිශයින් යෝග්‍ය වූ මාර්ගයක් බව මේ පරිවර්තනය මුල් කෘතිය හා සසඳන්නකුට පෙනී යනු නිසැක යි.''

- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර



Copyright©www.e-thaksalawa.moe.gov.lk

**05. (අ). බැද්දේගම නවකතාවේ භාෂාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් පහත දක් වේ. ඒවා හොඳින් කියවා ඔබ ඒ සම්බන්ධයෙන් එකඟ වන්නේ ද නො වන්නේ ද යන්න ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න.**

A. බැද්දේගම කැලෑ ගමක අත්දැකීම් පාදක කොට ගෙන රචිත නවකතාවක් නිසා එහි ගැමියන්ගේ කතාබහ එනම් කටවහර ඒ ලෙසින් ම යොදා ගෙන තිබේ.

B. සජීවී ව අවස්ථා නිරූපණය කරන සංවාදශීලී බස් වහරක් යොදා ගෙන තිබේ.

C. අවස්ථාවෝචිත ව ගැමි පරිසරය ඇසුරෙන් සකසා ගත් උපමා වලින් පිරිපුන් බස් වහරක් භාවිත කොට ඇත.

D. සංකේතාත්මකව අදහස් ප්‍රකාශ කරවන බස් වහරක් බොහෝ අවස්ථාවල දී දැකිය හැකි ය.

E. පාඨක සිතෙහි චිත්තරූප මවන බස් වහරක් යොදා ගෙන චරිත නිරූපණය කරයි.

F. බොහෝ විට කෙටි වැකි හා යෙදුම් භාවිතය දැකිය හැකි ය.

G. උපදේශාත්මක බවකුත් ගැඹුරු දාර්ශනික බවකුත් ඇති කියමන් යොදා ගෙන ඇත. ඒවා ද ගැමි පරිසරයෙන් ම උකහා ගෙන ඇත.

H. ප්‍රබල ධ්වනිතාර්ථ අන්තර්ගත යෙදුම් භාවිත කොට තිබේ.

**(ආ). ඔබ (අ) කොටසේ එකඟ වූ ලක්ෂණවලට ගැළපෙන උද්ධෘත පහත වේ නම් ඊට අදාළ භාෂා ලක්ෂණය තිත් ඉරි මත ලියන්න.**

A. ''නිරිත දිග තද සුළඟට ඇඹරවී ඇටුවන් බැහී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය ද නැමී ඇඹරී තිබිණ.''

..........................................................................................................................

B. ''ඇගේ සම ඇටයට ඇලී රැලි වැටී ගියේ ය. ළැම වියැළී ගොසින.''

..........................................................................................................................

C. ''කුඹුක් වැනි ගස්වල පිට පොත්ත තැනින් තැන ඉගිලී සුදුව යන්නාක් මෙන්...''


Copyright©www.e-thaksalawa.moe.gov.lk

..................................................................................................................................

D. ''ගං ඉවුරෙ අලි ඇට නරි අදිනවා කියලා අනිත් අලි ගඟේ නාන්නේ නැතුව අරිනවා ද?''

..................................................................................................................................

E. 'උඹේ ගම කොහෙ ද ළමයා?'

'මං ආවෙ බැද්දේගම ඉඳලා.'

'බැද්දේගම,' ඔව් මං දන්නවා. බොහොම ඉස්සර හිට දන්නවා ඒ ගම ගැන. මාත් ඒ පැත්තේ තමයි. බැද්දේගමටත් එහා මහවෙලගම. උඹ ගමට පලයන් ළමයා.'

'ඉතින් මගෙ මිනිහා, සීයෙ? එයාට මොකද වුණේ'

..................................................................................................................................

F. ''පුංචිමැණිකා එතැනින් නැගිට සෙමින් සෙමින් කන්ද නැග හිර ගෙය වටේ ගියා ය. එහි වූයේ එකම දොරටුවකි. ඒ තැනින් තැන යකඩ ඇණ වැද්දූ විශාල ඝන ලී දොරකි.''

..................................................................................................................................

G. ''මාසෙකට කලින් වෙන්ඩ බෑ-මොකද, තව නැහැ හේන් කැපුවෙ, වැපුරුවා විතරක්නෙ දැන්. නෑ, නෑ, නෑ, තුන් මාසෙකට කලින් වෙන්ඩ ඕනෑ. මෝඩයා තුන්මාසයක්? මොකද කුරක්කන් අනූ දා වී වගේ ද?''

..................................................................................................................................

H. ''එදා ඔවුන් මෙන් අද තමා ද මහ වන මැද තනි වී සිටින බවත් එදා ඔවුන්ට මෙන් ම අද තමාට ද මග වැරදී තිබෙන සැටිත් ඇ දුටුවා ය. එහෙයින් දැන් ඇට ද කොයි මගක ගියත් එක ය.''

..................................................................................................................................

I. ''ඔවුහු කෑම කති, නිදා ගිනිති. කිසිවකු සමග කතා නො කරති. එසේ ම අන් හැම දෙනා ද උන් හා කතා නො කරති.''

..................................................................................................................................

**06. බැද්දේගම ක්‍රමයෙන් විනාශ වන ගමක් බව දක්වෙන පෙර නිමිති.**

❖ **ගමෙහි ජීවත් වූ විසිපස් දෙනෙක් වූ පිරිසෙන් එකිනෙකා වරින් වර ගමට අහිමි වන අයුරු**

- සිලිඳු ..................................................................................................
- බබුන් ..................................................................................................
- බබෙහාමි ආරච්චිල ..................................................................................
- ප්‍රනාන්දු ..................................................................................................
- නැන්චොහාමි හා දරුවන් ........................................................................

(ඉහත සඳහන් අයවලුන් ගමට අහිමි වන අයුරු තිත් ඉරි මත ලියන්න.)



Copyright©www.e-thaksalawa.moe.gov.lk

❖ **අවුරුදු ගණනක් ස්වභාව ධර්මයේ අණසකට යටපත් නොවී ඉතාමත් ප්‍රතාපවත් ලෙස ගම මැද නැගී හුන් ආරච්චි නිවස වැහි තුනක දී විනාශ වූ අයුරු**

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(අදාළ උද්ධෘතය උපුටා ලියන්න.)

❖ **ගම රැක ගැනීමට මතු පරපුරක් නූපදින බවත් භයානක අදෘශ්‍යමාන බලවේගයන්ටත් සතා සීපාවටත් ඉක්මනින් ම ගම යටත් වන බව යමෙකු වටහා ගෙන තිබීම.**

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(නැන්චොහාමිගේ ප්‍රකාශය උපුටා දක්වන්න.)

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර

Copyright©www.e-thaksalawa.moe.gov.lk

# ඒකකය - (04)

## බැද්දේගම

### පිළිතුරු පත්‍රය

**01.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (3) | 4. | (2) | 7. | (1) | 10. | (4) |
| 2. | (1) | 5. | (3) | 8. | (3) | | |
| 3. | (3)/(4) | 6. | (4) | 9. | (4) | | |

**02.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | ✓ | 5. | × | 9. | ✓ | 13. | ✓ |
| 2. | ✓ | 6. | × | 10. | ✓ | 14. | ✓ |
| 3. | × | 7. | × | 11. | ✓ | 15. | × |
| 4. | ✓ | 8. | ✓ | 12. | ✓ | | |

**03.**

1.
   1) පුංචිරාළ/වෙදරාළ/අලුත් මුලාදෑනියා
   2) බබුන්
   3) පුංචිමැණිකා
   4) පුංචිමැණිකා බබුන් ගැන තොරතුරු විමසීමට පුංචිරාළ වෙතට ගිය අවස්ථාවේ
   5) ස්වාමි-භාර්යා/අඹුසැමි

2.
   1) පුංචිමැණිකා
   2) පුංචිරාළ/වෙදරාළ
   3) බබුන්ගේ පැමිණීම පිළිබඳ ව
   4) බැද්දේගම
   5) මං අහපු ආරංචියක් නැහැ. කාගෙන්ද ආරංචි අහන්නේ

3.
   1) පුංචිමැණිකා
   2) මහලු මිනිසා
   3) බබුන්
   4) බැද්දේගම
   5) හිර ගෙදර

4.
   1) මහල්ලා
   2) පුංචිමැණිකා
   3) සිරගෙය
   4) තංගල්ල
   5) මහවෙලගම

5.
   1) හිරපල්ලා
   2) ඒක බොරු නඩුවක්. ආරච්චිගේ ගේ බින්දයි කියලා
   3) සිලිඳු, බබුන්, මහල්ලාගේ පුතා

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර

Copyright©www.e-thaksalawa.moe.gov.lk

4) හිරපල්ලා විස්තර කියන්නට මුදල් ඉල්ලීම

5) නමවෙනි පරිච්ඡේදය

6. 1) පුංචිමැණිකා

2) හිරපල්ලා

3) තමාට කිසිවක් කිව නොහැකි බවත්, කඹුරුපිටියට ගිහින් නඩුකාර හාමුදුරුවන්ට පෙත්සමක් දෙන ලෙසත් ය.

4) පුංචිමැණිකා/සිලිඳු/කර්ලිනාහාමි/හින්නිහාමි

5) බබුන් සිරගෙදර දී මිය ගිය බව

**04.** ❖ **සිලිඳු**

1. ප්‍රධාන
2. ගොවියෙකි
3. රිලවකු
4. ටිකක් පිස්සු
5. පලිගන්නා
6. පුංචිමැණිකාට/ප්‍රනාන්දු/තම දරුවන්ගේ/පියෙකු
7. යහපත්/උපක්‍රමයකින්/බබුන්/කර්ලිනාහාමි/මහෙස්ත්‍රාත් විභාගයට

❖ **කර්ලිනාහාමි**

1. සිලිඳුගේ
2. මියගොස්/දරුවා
3. පණහක්
4. සම/වියලී
5. සිහිනයකින්/පටල සහිත මොළය/කර්ලිනාහාමි/සංවේදී වන

❖ **පුංචිරාළ**

1. වෙදෙකු
2. ආරච්චිල
3. බබුන්/වසඟයට/පෙළුණු/කපටියෙකු

❖ **පුංචිමැණිකා** - සාහිත්‍ය සංග්‍රහය හොඳින් කියවා පිළිතුරු ලියන්න.

**05.** (අ). A. එකඟ වේ

B. එකඟ වේ

C. එකඟ වේ

D. එකඟ වේ

E. එකඟ වේ

F. එකඟ වේ

G. එකඟ වේ

H. එකඟ වේ



Copyright©www.e-thaksalawa.moe.gov.lk

(ආ). අවබෝධයෙන් පිළිතුරු ලියන්න.

**06.** සාහිත්‍ය සංග්‍රහයෙන් උපුටා දක්වමින් විචාරයේ යෙදෙන්න.

අන්තර්ගතය : තමින්ද කුමාර හෙට්ටිආරච්චි - විද්‍යාරාජ මහා විද්‍යාලය, හෝකන්දර

Copyright©www.e-thaksalawa.moe.gov.lk